අධ්‍යක්ෂ

නි. ක. අංශය

මගේ අංකය :- 23/3/5
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
මුතුකණ්ඩිය ව්‍යාපාරය
2017.10.30

මුතුකණ්ඩිය ව්‍යාපාරයේ සියලුම
ව්‍යාපාර කමිටු සාමාජිකයින් වෙත,

**ව්‍යාපාර කමිටු රැස්වීම් වාර්තාව - 2017 ඔක්තෝබර් මාසය.**

මුතුකණ්ඩිය ව්‍යාපාරයේ මාසික ව්‍යාපාර කමිටු රැස්වීම 2017.10.26 දින පෙ.ව.9.30 ට මුතුකණ්ඩිය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ දී පැවැත් විය.

සහභාගී වූ නිලධාරීන් -

| | |
|---|---|
| 01.එල්.සරත් පෙම්සිරි සිල්වා මහතා | - නේ: ව්‍යාපෘති කළමනාකරු,මුතුකණ්ඩිය |
| 02.ආර්.ජේ.ජී.සේනාරත්න මහතා | - නි:කෘෂිකර්ම අධ්‍යක්ෂ,මොණරාගල |
| 03.ජී.එල්.අයි.පී.ගුණවර්ධන මිය | - විෂයභාර නිලධාරී(අති.ආ.බෝග) |
| 04.එච්.එම්.අසංක නුවන් ප්‍රසන්න මහතා | - තාක්ෂණ සහහක,වාරිමාර්ග |
| 05.කේ.එම්.ඩබ්.උදය කුමාර මහතා | - සංවර්ධන නිලධාරී,මුතුකණ්ඩිය |
| 06.ආර්.එම්.පියරත්න මහතා | - සංවර්ධන නිලධාරී,මුතුකණ්ඩිය |

සහභාගී වූ ගොවිසංවිධාන නියෝජිත වරුන් -

| | |
|---|---|
| 01.ජී.එල්.චන්ද්‍රසිරි මහතා | - සභාපති, එක්සත් ගො.සං. |
| 02.ජී.එච්.බන්දුසේන මහතා | - ලේකම්, එක්සත් ගො.සං. |
| 03.ඩබ්.එම්.සුදුබණ්ඩා මහතා | - භාණ්ඩාගාරික ,එක්සත් ගො.සං. |
| 04.ආර්.එම්.මුතුබණ්ඩා මහතා | - සභාපති, විජිතපුර ගො.සං. |
| 05.කේ.ජී.ඩබ්.එම්.කරුණාරත්න මහතා | - සාමාජික,සිරිපැරකුම් ගො.සං. |
| 06.ඩබ්.ආරියවතී මිය | - සාමාජික,විජිතපුර ගො.සං. |
| 07.ආර්.ඉන්දික ප්‍රසාද් මහතා | - ලේකම්,එකමුතු ගො.සං. |
| 08.ඩී.එම්.හීන්බංඩේ මහතා | - සාමාජික,ගැමුණු ගො.සං. |
| 09.වයි.එම්.ගුණසේන මහතා | - අංක 38 ඇල නියෝජිත |
| 10.වෛ.ඩබ්.විමලාවතී මිය | - භාණ්ඩාගාරික,එකමුතු ගො.සං. |
| 11.එච්.එම්.ශිරෝමාලා මිය | - සාමාජික,රණමයුර ගො.සං. |
| 12.එච්.එම්.සුමනසේන මහතා | - සාමාජික,රණමයුර ගො.සං. |
| 13.ජේ.එම්.දයානන්ද මහතා | - ඇල නියෝජිත,රණමයුර ගො.සං. |
| 14.ජේ.එම්.ආර්.ජයසුන්දර මහතා | - සාමාජික,රණමයුර ගො.සං. |
| 15.එච්.එම්.ආරියදාස මහතා | - භාණ්ඩාගාරික,රණමයුර ගො.සං. |
| 16.එච්.කේ.ප්‍රියන්ත කුමාර මහතා | - සාමාජික,විජිතපුර ගො.සං. |
| 17.කේ.ජී.චන්දන නිශාන්ත මහතා | - සාමාජික,ගැමුණු ගො.සං. |
| 18.ඩී.ප්‍රියන්ත ඉලේපෙරුම මහතා | - සාමාජික,විජිතපුර ගො.සං. |

<u>පිළිගැනීම හා අරමුණු පැහැදිලි කිරීම</u> -

ආගම සිහි කිරීමෙන් අනතුරුව කමිටුවට සහභාගී වී සිටි සියලුම දෙනා ව්‍යාපාර කළමනාකාර මහතා විසින් පිළිගන්නා ලදී. 2017/18 මහ වගා කන්නය සැළසුම් කිරීම, වාපි සගරාව සැකසීම සඳහා මූලික සාකච්ඡාව පැවැත්වීම, මෙදින රැස්වීමේ මූලික අරමුණු බව පැවසීය.

අනතුරුව පසුගිය රැස්වීමේ වාර්තාව ඉදිරිපත් කළ අතුර,එම වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙසට රණමයුර ගොවිසංවිධානයේ භාණ්ඩාගාරික මහතා කල යෝජනාව විජිතපුර ගොවිසංවිධානයේ සභාපති මහතා විසින් ස්ථිර කරන ලදී.

| අනු අංක | විෂය ක්ෂේත්‍රය | සාකච්ඡා කල කරුණු / ගනුලැබූ තීරණ | වගකීම |
|---|---|---|---|
| 01 | ආයතන සංවර්ධනය | පුහුණු වැඩසටහන් යටතේ ගම්මාන 01 කාන්තා අනු කමිටුව සඳහා ගම්මිරිස් වගාව හා ආහාර තාක්ෂණ පුහුණු වැඩසටහනක් 2017.10.27 දින පැවැත්වූ අතර, අනෙකුත් කාන්තා අනු කමිටු සඳහා ඉහත වැඩසටහන පැවැත්විය යුතු බව නෝ:ව්‍යාපාර කළමනාකාර මහතා ප්‍රකාශ කරන ලදී. | අදාල ගොවිසංවිධාන හා සං.නිලධාරී |
| | | ගොවි සංවිධාන නඩත්තු ගිණුම් ආරම්භ කිරීම - මේ වන තෙක් නඩත්තු ගිණුම් ආරම්භ කර නොමැති ගො.සං.සඳහා නඩත්තු ගිණුම් විවෘත කිරීම කඩිනම් කලයුතු බව දැන්වීය. | අදාල ගොවිසංවිධාන හා සං.නිලධාරී |
| | | සෑම ගොවි සංවිධානයකම මහසභා / කාරක සභා පවත්වා මහ කන්නය සාර්ථක කර ගැනීමට, මූලික බිම් සැකසීම වර්ෂා ජලයෙන් සිදුකිරීමටත්, වැවේ අඩු ජල ධාරිතාවයක් පවතින බැවින් ජලය නිකුත් කිරීමට පෙර ඇලවේලි ශුද්ධ පවිත්‍ර කර ඉදිරි කන්නයට සූදානම් විය යුතු බව සාකච්ඡා විය.<br><br>ගොවින් දැනුවත් කිරීමට ශබ්ද විකාශන යන්ත්‍රයක් උපයෝගී කර ගැනීමටත්, 2017.11.05 දිනට පෙර ඇලවේලි ශුද්ධ කර අවසන් කලයුතු බවත් 2017.11.09 දින කන්න රැස්වීම පවත්වා 2017.11.15 දිනට ජලය නිකුත් කිරීමට යෝජනා කරගත යුතු බවත් ගොවි නියෝජිතයින්ගේ අදහස විය. | අදාල ගොවිසංවිධාන |
| 02 | මෙහෙයුම් හා නඩත්තු | දැනට සිදුකරගෙන යන පුනරුත්ථාපන කටයුතුවල අඩුපාඩු පවතින බවත්, ඇලවේලි නිසි පරිදි නඩත්තුවී නොමැති නිසාත්, වැවේ අඩු ජල ධාරිතාවයක් පවතින නිසාත්, ගොවින් විසින් ශුද්ධ පවිත්‍ර කල යුතු ඇලවේලි හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් නිමකල යුතු වැඩ කොටස් ජලය නිකුත් කිරීමේ දිනට පෙර සිදුකල යුතු බවට සාකච්ඡා කර ගන්නා ලදී. | ගොවිසංවිධාන සහ වාරිමාර්ග දෙපා: |

| | | | |
|---|---|---|---|
| 03 | වාරිමාර්ග ගැටලු | අදහස් දැක්වීම - ගම්මාන 06 ඩබ්.ආරියවතී මිය FC 61 ඇලේ ජල ගැටලුව මේ වනවිට කීප වාරයක් ඉදිරිපත් කර ඇත. එය හැකි ඉක්මනින් විසඳා දිය යුතු බව දන්වන ලදී.<br><br>FC 10 ඇල නියෝජිත - ගම්මාන 02 FC 10 ඇල පුණරුත්ථාපනයට ඇතුලත් කර නොමැති අතර, එම ඇල පුණරුත්ථාපනයට ඇතුලත් කලයුතු බව දැන්විය.<br><br>DC 06 ඇලේ අත්‍යාවශ්‍ය ස්ථාන පරීක්ෂාකර බලා ශුද්ධ කර ගැනීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් JCB යන්ත්‍රයක් ලබාදීමට කටයුතු කරන ලෙසත්, FC 60 - 61 ඇලවල් පුණරුත්ථාපනයට ඇතුලත් කර නොමැති අතර, එම ඇලවල් ඉතා අබලන් බැවින් පුණරුත්ථාපනයට ඇතුලත් කරන ලෙස ගම්මාන 06 ගො.සං.සභාපති ආර්.එම්.මුතුබණ්ඩා මහතා ඉල්ලීමක් කරන ලදී.<br><br>ගම්මාන 02 ගොවිසංවිධානයේ ඉතිරි වැඩ කොටස් නිමකර ගැනීම සඳහා ද JCB යන්ත්‍රය පැය 04 ක් වත් ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී. | ඉංජිනේරු සහකාර |
| 04 | කෘෂිකර්ම සංවර්ධනය | අදහස් දැක්වීම - නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අ.ප.වා) දැනට පවතින දේශගුණික තත්වයන් සලකා බලා තවත් වසර ගණනාවක් යන තුරු යල මහ කන්නය නිශ්චිතව තේරුම් කර ගත නොහැකි බව කාලගුණ විද්‍යාඥයන් පෙන්වා දී ඇත. එබැවින් දැනට ලැබෙන වර්ෂා රටාවට අනුව ගොවීන් අනුවර්තනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.<br><br>ඉදිරි මහ කන්නය සැළසුම් කිරීමේදී ඊට ගැලපෙන ලෙස වී වගාවට අමතරව අගාවත ජල අපහසුතා ඇති කුඹුරු ඉඩම් වල අතිරේක ආහාර බෝග වගා කිරීමට යොමුවිය යුතු බව පෙන්වා දෙන ලදී.<br><br>අතිරේක බෝග වගාවට කැමති ගොවීන් සඳහා මුං ඇට, රටකජු, කව්පි, කුරක්කන්, උඳු, සෝයා බෝංචි, බඩ ඉරිඟු බීජ නොමිලේ සහ 50 % දායකත්වය යටතේ ලබාදිය හැකිබව කීය. එම බීජ නියගයෙන් පීඩාවට පත් ගොවීන්ට සහන සැලසීම 2017 වැඩසටහන යටතේ ලබා දීමට නියමිතය. | |

| | | | |
|---|---|---|---|
| | කෘෂිකර්ම සංවර්ධනය | විද්‍යානුකූල ජල කළමනාකරණ යටතේ FC ඇලක් තෝරාගෙන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව ද පැවසිය. | |
| 05 | වෙනත් | අදහස් දැක්වීම- නේවාසික ව්‍යාපාර කළමනාකරු<br><br>ක්‍රියාකාරී ගොවිසංවිධාන සාමාජිකයන් හා කාන්තා අනු කමිටු සාමාජිකාවන් දිරි ගැන්වීම සඳහා 2017.11.05 දින වාරිමාර්ග කළමනාකරණ අංශය මගින් ගොවි උපකරණ ලබාදීමට කටයුතු කර ඇත. ඒ සඳහා ලබාදී ඇති නිර්නායක අනුවම ප්‍රතිලාභීන් තෝරා නාම ලේඛණ ලබා දීමට ගොවි සංවිධාන කටයුතු කරන ලෙසට දැන්විය.<br><br>'වාපි' සගරාව සකස් කිරීමේ මූලික සාකච්ඡාව 2017.11.06 - 07 දෙදින වාරිමාර්ග කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ තුමියගේ සහභාගිත්වයෙන් පැවැත්වෙන බැවින් , ඊට අදාල කරුණු සහ පුද්ගලයන් තෝරාගෙන එම කාර්යය සාර්ථක කර ගැනීමට සහය වන ලෙස ඉල්ලා සිටින ලදී. | |
| 06 | ස්තුතිය | අද දින සාකච්ඡා කරගත් කරුණු ඉටුකර ගැනීම සඳහා උපරිම ලෙස සහය වන ලෙස සියලු ගොවි නියෝජිත වරුන්ගෙන් ඉල්ලා සිටි අතර, මෙදින ව්‍යාපාර කමිටු රැස්වීම සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම රජයේ නිලධාරි මහතුන්ට සහ ගොවිසංවිධාන නියෝජිත වරුන්ට ස්තුතිය ප්‍රකාශ කරමින් රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී. | |

මී ලග රැස්වීම් දිනය - 2017.11.30 පෙ:ව: 9.30. ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ දී.

එල්.සරත් පෙමසිරි සිල්වා
නේවාසික ව්‍යාපාර කළමනාකරු
මුතුකණ්ඩිය ව්‍යාපාරය